# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 08

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

DECEMBER 10, 2009 දෙසැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2553 උඳුවප් මාසය) http://www.lankaheritage.com/lankaviththi/


# දම්වැලේ දුබලම පුරුක




♦ සංජය විමලරත්න විසිනි

**ප**සුගිය සති කීපයක් තුළ ලංකාවේ පුවත්පත් සහ වෙබ් අඩවි අනුව බලන විට රටේ මහ කළබැගෑනියක් පවතින බව අවබෝධ විය. ඒ තත්වය කුළුගැන්වෙමින් හිටපු යුදහමුදාපතිවරයා ලබන ජනපතිවරණයට තරඟ කරන්නට යන බව ප්‍රකාශ කිරීමෙන් පසුව විවිධ ප්‍රචාරක කටයුතු මෙලෝ සිහියක් නැතුව දියත්කර ඇති බව පෙනේ. මේ සියළු දේ විමර්ශණය කරමින්, අප රටේ උන්නතිය අපේක්ෂාකරන දේශප්‍රේමීන් කල්පනා කළයුතු ආකාරය සහ ගතයුතු ක්‍රියා මාර්ගය පැහැදිලි කිරීම මෙම ලිපියේ අරමුණ වෙයි.

## ප්‍රතිගාමීන් ලද පරාජයන්

දැනට හය මාසයකට පමණ පෙර යුද්ධයෙන් කොටි ත්‍රස්තයින් අන්ත පරාජයකට පත්වීමත් සමග අධිරාජ්‍ය ගැති ප්‍රතිගාමීන් අන්දුන් කුන්දුන් වූ අයුරු අපි මනාසේ දුටුවෙමු. ඒ අවස්ථාවේ අධිරාජ්‍යවාදීන්, විශේෂයෙන්, එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය ප්‍රමුඛ යුරෝපීය සමූළුවේ රටවල සමහරු යුද්ධයට සම්බන්ධිතව සිදුවූයේයයි මේ රටවල මාධ්‍යකාරයින් ගෙනගිය විෂම ප්‍රචාර යොදාගනිමින් අප රටට වින කරන්නට ක්‍රියාකාරී වූහ. අප රටේද සිටින අධිරාජ්‍ය ගැති ප්‍රතිගාමීන් විශේෂයෙන් විරුද්ධ පක්ෂනායක රනිල් වික්‍රමසිංහ ද, යන එන මං නැතිව සිටින මංගල සමරවීර වැනි දේශපාලන කළපුවේ පාවෙන පොල්ලෙලි කැලි ද, නෝර්වේ ඇතුළු යුරෝ රටවල සංචාරය කරමින් අපට එදිරිව උන්ට උල් පන්දම් දුන්නෝය.

අප රජය ලෝකයේ අපට හිතවාදී රටවල් සහ මිතුරු බලවේගවලද උදව් ඇතිව ඉතා ප්‍රයෝගශීලී ලෙස හැම මට්ටමකින්ම අපට වින කළ මේ කූට ප්‍රයත්න කප්පාදු කරගැන්මට සමත් වූවාය. යුද්ධය සමයේ සහ එයට පසුවද බටහිර රටවල ලැගුම් ගෙන ඇති ද්‍රවිඩ ඩයස්පෝරාවද මොවුන් සමග එකතුව අපට එරෙහිව කළ ප්‍රයත්නද මට්ටම් කරදැමීමටද රජයට හැකිවිණ. කොටි බලවේගය නැවත පණගැන්වීමට ඉදිරිපත් වූ කේපී වැන්නන්ද අත් අඩංගුවට ගෙන ඒ ක්‍රියාකාරිත්වයද එතැනම අඩපණ කරන ලදී. ඉන් පසු කොටින්ගේ ලෝක ද්‍රවිඩ රාජ්‍යයක් මැවීමේ පම්පෝරියද පුස්ස බින්දාක් මෙන් විය. මේ සියල්ල දුටු අප මුලින් සඳහන් කළ දේශීය ප්‍රතිගාමී ද්‍රෝහියෝ හෙමින් පල්ලම් බැස ඒ වන විට රජය දියත් කර තිබුණු පළාත් සභා ඡන්දයට නැවත මතු වී ආහ.

## පළාත් පාලන ඡන්දය

යූඇන්පිය ප්‍රමුඛ ප්‍රතිගාමී බලවේග පළාත් පාලන ඡන්ද වලින්ද ලද අන්ත පරාජයන් ඔවුන් කෙරෙහි ජනතාව දක්වන ද්වේශය හොඳින් පැහැදිලි කරන්නක් වීය. සාමාන්‍යයෙන් ඒ අයට කව දත් වාසි සහගතව පැවති ඌව වැනි ප්‍රදේශවලද ජනතාව මෙම ප්‍රතිගාමීන්ගේ ද්‍රෝහී පිළිවෙත් පැහැදිලිවම ප්‍රතික්ෂේප කළහ. ඒ සමගම මෙම පළාත් සභා ඡන්දවලින් තව හොඳ පාඩමක් ලද්දේ ජනතා විමුක්ති පෙරමුණයි. යුද්ධය පැවති සමයේ දේශප්‍රේමී පිළිවෙතක් ගෙන ගිය එම පක්ෂය බලා පොරොත්තු වූ ජන සහයෝගය නොලද බව පෙනිණ. විශේෂයෙන්ම එයට හේතු වූයේ ඒ වන විට ඔවුන් ගෙන තිබූ රජයට එරෙහි ප්‍රතිපත්තිය යයි හැඟේ. ලබාගත් ජයග්‍රහණ මත පිහිටා රට හා ජනතාව ඉදිරියට ගෙනයෑමේ වගකීම ඔවුන් වැනි කණ්ඩායමකට දීමට ජනතාව මැලිවූහ. ජේවීපියට තිබුණු ආසන බලයන් පවා නැතිවිය. මෙයින් වියරු වැටුනාක් මෙන් සිටින ඔව්හු අද අර යන එන මං නැතිව අතරමං ව සිටින අනෙක් දේශපාලන කණ්ඩායම් සේම මංමුලා ස්වභාවයකින් කටයුතු කරති. ඔවුන්ට වෘත්තීය සමිති බලවේග, ශිෂ්‍ය බලවේග සියල්ල තිබේයයි යන අදහස ඇතිව රටේ ආර්ථිකය අඩපණකිරීම සඳහා වර්ජන

4 වන පිටුව බලන්න ➤

## පාඨක ඔබ සැමට සුබ අසිරිමත් නත්තලක් වේවා!



*The birth of Christ* - කිතු උපත Painting by Thalangama Jayasinghe - *Sri Lanka*

| | | |
|---|---|---|
| සි ත | චකිතයක් නැත හෙට එළිවෙන | තුරුම |
| අ ත | දරුවෙකු නිදයි ලැබ උණුසුම | පරම |
| ඇ ත | නියමයක් ලෙස ලෝ දම් තුළ | අරුම |
| නැ ත | ආදරය කිසිවෙකු අම්මා | තරම |

No anxiety what so ever until the dawn
Utmost warmth assures an infant's sleep
An amazing edict designed by the nature just
That no one ever loves us like the mother does

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*




අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරි, අසිරිමත් නත්තලක් සහ සුබ නව වසරක් වේවා!

FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3